# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1652/3 - 2010 මැයි 03 වැනි සඳුදා - 2010.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුව පිරවීම

බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ වැඩ බලන ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65 (2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස හිතනාදුර විජිත් ප්‍රියන්ත ද සිල්වා මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින්, හිතනාදුර විජිත් ප්‍රියන්ත ද සිල්වා මහතා, එම පුරප්පාඩුව සිදු වූ කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරීපත් වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී ය.

05 - 344

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

### බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුව පිරවීම

බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ වැඩ බලන ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65 (2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස අනන්ද ලක්ෂ්මන් විජේමාන්න මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ජන්ද විමසීම් පනතේ 65 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින්, අනන්ද ලක්ෂ්මන් විජේමාන්න මහතා, එම පුරප්පාඩුව සිදු වූ කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරීපත් වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී ය.

05 - 345

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.